


දශක තුනක් තිස්සේ උතුරේ පැවැති යුද්ධයේ අවසාන දින කිහිපය තුළදී රජයේ හමුදාවන්ට බාරවූ එල්.ටී.ටී.ඊ. ඉදිරි පෙළ සාමාජිකයන් අතර එම සංවිධානයේ දේශපාලන අංශයේ කාන්තා නායිකාව තමිළිනී ජෙයක්කුමාරන් ද විය. යුද ජයග්‍රහණයෙන් පසුව රජය ක්‍රියාත්මක කළ පුනරුත්ථාපන වැඩ පිළිවෙළ යටතේ නැවත සමාජ ගත කෙරුණු ඇය ඉන් වසර කිහිපයකට පසුව මහරගම පිළිකා රෝහලේදී ජීවිතක්ෂයට පත්වූයේ පිළිකා රෝගියෙකුවය. පිළිකා රෝගයට ගොදුරුව මරණය අභිමුව සිටියදී ඇය එල්.ටී.ටී.ඊ. සංවිධානය හා සම්බන්ධ සිය ක්‍රියාකාරකම් සහ බිහිසුණු අත්දැකීම් පිළිබඳ තබන ලද

ලිඛිත සටහන් පසුව දෙමළ භාෂාවෙන් පොතක් ලෙස ප්‍රකාශයට පත් කෙරිණි. එහි ඇතුළත් කරුණු දෙමළ සමාජය තුළ මහත් විවාදයටද, බාහිර සමාජයේ මහත් අවධානයටද ලක්වීය.

අතිමහත් සමාජ පිරිවැයක් දරමින් එල්.ටී.ටී.ඊ. යුද සංවිධානය වැනසීමට රජයේ හමුදා සමත් වුවද, එම සංවිධානයේ නැඟීමට සහ පැවැත්මට බලපෑ හේතු නැසීමට රජය මෙතෙක් සමත්වී නැත. උතුරේ දෙමළ ජාතිවාදයද, නැඟෙනහිර මුස්ලිම් ජාතිවාදයද, දකුණේ සිංහල ජාතිවාදයද මේ මොහොතේ නව වටයකින් හිස ඔසවමින් සාමකාමී පුරවැසි සමාජයට සන්නිවේදනය කරන පනිවිඩයද බෙහෙවින් භයානකය. එවැනි පසුබිමක මද අස්වැසිල්ලක් භුක්තිවිඳිමින් සිටින දැනුම්වත් සිංහල පුරවැසි සමාජයට තමිළිනීගේ මරණාසන්න ස්මරණය මගින් ලබාදෙන පනිවිඩයේ ඇති සුවිශේෂීත්වය සළකා එහි සිංහල පරිවර්තනය කොටස් වශයෙන් ඔබ වෙත ගෙනඑන්නෙමු. තමිළිනී දෙමළ බසින් තැබූ සටහන් සිංහලයට නැඟූ ආචාර්ය ස්වාමිනාදන් විමල් සහ ඒ සඳහා අවශ්‍ය සෙසු සම්පත්දායකත්වය සැපයූ සිනමාවේදී ධර්මසිරි බණ්ඩාරනායක දෙපළට මෙහිදී අපගේ විශේෂ ස්තුතිය පිරිනමමු.

## සන්නසට සකස් කරන්නේ - ශ්‍රීලාල් සෙනෙවිරත්න

## 'තමිළිනියක්කා'යි නම කියා කතා කොට වෙඩි තැබීම

පොළොන්නරුව නගරයෙහි හෝටලයක් අසළ කෞෂල්‍යන්ගේ වාහනය නතර විය. මා හට දුරකථන ඇමතුමක් ගත් කෞෂල්‍යන් 'අක්කේ එන්න මොනව හරි කාල යමු.' යැයි කීවේය. මමත් මගේ කණ්ඩායමේ සටන්කාමී සහෝදරියනුත් පිටත්වීමට පෙර අපේ කඳවුරේදී කෑම කෑවෙමු. අපට අවශ්‍ය වන වතුර බෝතල්ද, බිස්කට් පැකට්ද, වාහනයෙහි තිබුණි.

මෙවැණි දිගු දුර ගමන්වලදී ඉතාමත් දැඩි අවශ්‍යතාවක් මතුවුවහොත් මිස මම වාහනය අතරමඟ නතර කර පමා වන්නේ නැත. සටන්කාමී පිරිමින්ට වඩා කාන්තාවන් පහසුවෙන් හඳුනාගැණීමට හැකි හෙයින් රජයේ පාලනයට අයත් ප්‍රදේශ මැද්දෙන් ගමන් කරන විට මහත් පරෙස්සම් සහගතවීම මගේ පුරුද්දක් විය. එහෙයින් අප ආහාර අනුභව කර සිටි බව පවසා අප ඉදිරියට යන බවත් ඔවුන්ට කෑම කා එන ලෙසත් දැනුම් දුන්නෙමි. අපි ගමන්ගත් වාහනය ඉදිරියට ඇදෙන්නට විය. කෞෂල්‍යන් මඩකළපුවටත් මම තිරුක්කෝවිල් ප්‍රදේශයටත් යා යුතුය. අපේ වාහනය මහියංගනය පාරේ අම්පාර කරා ගමන් කරමින් තිබුණි. ඊට පසුව කෞෂල්‍යන් මට දුරකථන ඇමතුමක් දුන්නේ නැත. මමද නොගත්තෙමි.

ඒ වන විට වේලාව රෑ දහය පසුවී ඇතැයි සිතමි. කිලිනොච්චියෙහි පිහිටි දේශපාලන අංශ භාරකරුගේ ප්‍රධාන දුරකථන මධ්‍යස්ථානයෙන් මට දුරකථන ඇමතුමක් ලැබිණ.

'තමිළිණියක්කා, ඔයාලට මොකක් හරි ප්‍රශ්නයක්ද?'
'අපට කිසිම ප්‍රශ්නයක් නෑ. ඇයි මොකද එහෙම ඇහුවේ?' යැයි මම ඇසුවෙමි.
'අද කිලිනොච්චියේ ඉදන් පිටත්වෙච්ච අපේ වාහනයකට ගහලා. ඒක ක්ලියර් කරගන්ඩයි ඇහුවේ. ඔයා සුදානම් පිට ඉන්ඩ. ටික වේලාවකින් ආපහු ගන්නම්.'

අවසන් වතාවට පොළොන්නරුවේ නගර ප්‍රදේශයේ කෞෂල්‍යන්ගේ වාහනය අතහැර අපේ වාහනය පැමිණීම මගේ මතකයට නැඟුණි. මම වහාම කෞෂල්‍යන් සමඟ දුරකථනයෙන් සම්බන්ධවීමට උත්සාහ ගත්තෙමි. දුරකථනය නාද වුවත් පිළිතුරක් ලැබුණේ නැත. කෞෂල්‍යන් කුමක්දෝ ප්‍රශ්නයකට මුහුණ දී ඇති බව පැහැදිලිය. ටික වේලාවකට පසුව කිලිනොච්චියෙන් නැවතත් දුරකථන ඇමතුමක් ලැබිණ.
'කෞෂල්‍යන් ගිය වාහනයට තමයි වැලිකන්ද හරියෙදි ගහලා තියෙන්නේ. කවුරුත් බේරිලා නෑ. අම්පාරේ මන්ත්‍රී චන්ද්‍රනේරුත් වාහනේ ඉඳලා තියනවා. එයත් මැරිලා.'

කිලිනොච්චියෙහි සිට එකට පිටත්වී ගමන අවසන්වීමට පෙර එකට එක්වූ සටන්කාමී පිරිසකගේ මරණය හිත් කැළඹීමට පත් කළේය. කෞෂල්‍යන් ඉතාමත් හිතවත් බැඳීමකින් යුතුව ආශ්‍රය කළ හැකි සටන්කාමියෙකි. පෙර මඩකළපුව දිස්ත්‍රික්ක යෙහි මුල්‍ය කටයුතු භාරව සිට පසුව දේශපාලන අංශ භාරකරු ලෙස ඔහුව පත් කෙරුණි. කිලිනොච්චියට පැමිණෙන විට ඔහු අපේ කඳවුරට පැමිණ මඩකළපුවෙහි සටන්කාමී කාන්තාවන්ගේ වැඩ කටයුතු පිළිබඳව සාකච්ඡා කරයි.

ඔහු මඩකළපුවේ පැවැති කාන්තා සමුළුවේ දී තමන් විවාහවීමට අදහස් කරගෙන සිටින තරුණියව මට හඳුන්වා දුන්නේය. විවාහ දිවියට පිවිසි පසුව අපේ කිලිනොච්චි කඳවුරට ඔවුන් දෙදෙනා පැමිණියහ. නැඟෙනහිර විශ්වවිද්‍යාලයෙහි උපාධිධාරිණියක වූ ඇය සහ කෞෂල්‍යන් ආදරණීය යුවළක් ලෙස ජීවත් වූහ. කෞෂල්‍යන් මිය යන විට ඔහුගේ බිරිඳ ගැබිණියකව උන්නාය. මරණය පිළිබඳ පුවත දැන ගන්නට ලැබුණු වහාම එම කාන්තාවගේ දුර්භාග්‍යසම්පන්න බව පිළිබඳව මගේ හිත සැණෙන් වේදනා විඳින්නට විය. අපේ අයිතිවාසිකම් සඳහා වන අරගලයේ දී මෙවැණි සිදුවීම් දහස් ගණනක් පසුකර සෑම අරගලකරුවෙකුම පැමිණ යුතු විය. එහෙත් මෙම සිදුවීම් විසින් ඇති කරන ලද තුවලා වේදනා දරා ගැණීම මහත් අසීරු විය.

අපි සුනාමි සහනාධාර කටයුතු සඳහා අම්පාර දිස්ත්‍රික්කයේ තිරුක්කෝවිල් ප්‍රදේශයට ගොස් සිටි අවස්ථාවේ පාර්ලිමේන්තු මන්ත්‍රී චන්ද්‍ර නේරු මහතා අපට මහත් උපකාර කළේය. එම ප්‍රදේශයේ දෙමළ ජනතාව අතරෙහි ඔහු මහත් අසීමිත විශ්වාසයක් දිනාගෙන උන්නේය. වෙල්වනායගම් මහතාගේ කාලයෙහි සිට ඔවුන්ගේ පවුල දේශපාලනය සමඟ සම්බන්ධව සිටි බව එහි දී දැනගන්නට ලැබුණි.

එහිදී ඔහු සමඟ මිය ගිය සියලු දෙනාගේම ආදාහන කටයුතු මහත් උත්සවාකාරයෙන් පැවැත්වූහ. සාම මහලේකම් කාර්යාලයෙහි සංවිධානයෙන් දේශපාලන අංශ භාරකරු කිලිනොච්චියෙහි සිට හෙලිකොප්ටරයෙන් පැමිණ අවසන් කටයුතුවලට සම්බන්ධ වූවේය.

කෞෂල්‍යන් වෙත එල්ල කළ ප්‍රහාරයෙන් පසුව සටන්කාමීන්ට ණිදහසේ කටයුතු කිරීම මහත් තර්ජණාත්මක දෙයක් බවට පත්විය. සුනාමි ආපදාවෙන් පීඩාවට පත්ව සිටින්නන් උදෙසා වන වැඩසටහන් අඩුවන්නට විය.

ණිවෙස්වලට හාණියක් නොවූ ජනතාව තම ණිවෙස්වලට ගියෝය. ණිවෙස් මුළුමණින්ම විනාශවුණු ජනතාවට තාවකාලිකව ටක රංවලින් ණිවාස සෑදුවේය. තවද මාර්ග ප්‍රතිසංස්කරණය, විදුලි බලය සැපයීම ආදිය ද අදාළ දෙපාර්තමේන්තුවලින් සිදුකරමින් තිබිණ. අම්පාර ප්‍රදේශයෙහි දිගටම වැඩ කිරීම සඳහා දේශපාලන අංශයෙහි කාන්තා කණ්ඩායමක් ඇති කළෙමි. ඔවුන් සඳහා අත්දැකීමක් වශයෙන් ද, ඉතාමත් දුෂ්කර ගමකට අත්‍යාවශ්‍ය කටයුතු කීපයක් ඉටුකර දීමක් වශයෙන්ද තංගවේලායුදපුරම් තෝරාගෙන එහි එක්දින 'ග්‍රාමීය වැඩමුළුවක්' පැවැත්වූයෙමි.

තිරුක්කෝවිල්, තම්බුලුවිල්, විනයාගපුරම් ආදී ගම්වලට අයත් ජනයාගේ හේන් ගොවිතැන සඳහා වූ ගම වශයෙන් එය පැවැතිණ. කුඩා වෙළඳ සලක් සහ කුඩා පාසලක් එහි විය. හේනේ වැඩ නැති කාලයට එම ගමේ ළමෝ වැඩි දෙනෙක් පාසල් එන බව එහි විදුහල්පති කීවේය. ප්‍රධාන පාරේ සිට වෙල්යායවල් මැදින් දිගු දුරක් ගමන් කර එම ගමට ගියෙමි. දින දෙකක් එම ගමේ වූ පාසලේ නතරව සිටියෙමි. ගෙයින් ගෙට ගොස් එම ගමේ මිණිස්සුන් මුණගැසුණෙමි. කොළ පැහැයෙන් හේන් භෝග වැවී අලංකාරවත්ව දර්ශනය විය. මඤ්ඤොක්කා, ඉරිඟු, කුරක්කන් සහ එළවළු වශයෙන් විවිධ භෝග වගා කර තිබුණි. කිසිම රසායණික පොහොරක් භාවිතා නොකර මහත් ස්වාභාවිකව ඉතාමත් සශ්‍රීකව එම භෝග වැඩී තිබුණි.

බාරෙතිවු කල්මුණේ ප්‍රදේශවල වැඩ කරමින් සිටි සටන්කාමී සාමාජිකාවෝ තිදෙනක් මා හමුවීමට තිරුක්කෝවිල්වලට පැමිණෙන බව දන්වා තිබුණි. 'තංගවේලායුදපුරම්' ගමේ කටයුතු අවසන් කර අපි අපේ කඳවුරට පැමිණියෙමු. සටන්කාමී සහෝදරියෝ බොහෝ දෙනෙක් වැඩ කටයුතු සඳහා බැහැරව ගොස් උන්හ. 'ග්‍රාමීය වැඩපළ' වැඩසටහනට ආරාධනා ලබා පැමිණ සිටි ගුරුවරුන්ව පිටත්කර යැවීම සඳහා අපේ වාහනය අක්කරෙ පත්තුව කරා ගොස් නැවත පැමිණ තිබුණි. ජීවිත තර්ජන අධික වූ හෙයින් සටන්කාමියෙකු බැහැරට යවන අවස්ථාවක ඉතාමත් දැඩි අවදානම් සහගත බකින් කටයුතු කළ යුතුව තිබුණි.

ටික වේලාවකින් තරුණයෙක් අපේ කඳවුරට දුවගෙන ආවේය. 'සංවිධානේ අක්කලා තුන් දෙනෙක්ව තම්පට්ටෙට පාරෙදි වෙඩි තියලා. වෙඩි තියපු අය පැනලා ගිහින්. දැන් තමයි ඒ දෙන්නව තිරුක්කෝවිල් ඉස්පිරිතාලෙට ගෙනාවේ.'

වහාම කඳවුරේ තිබූ පාපැදිය රැගෙන තිරුක්කෝවිල් රෝහලට ගියෙමි. එක් සහෝදරියක් පමණක් පියවි සිහිය සහිතව කථා කළ හැකි තත්ත්වයක උන්නාය.

ඔවුන්ව අක්කරෙපත්තු රෝහලට ගෙන යෑම සඳහා ගිලන් රථයට නංවා තිබුණි.

ඔවුහු ත්‍රිරෝද රථයකින් තිරුක්කෝවිල් ප්‍රදේශයට පැමිණෙමින් සිටියදී පාපැදියකින් පැමිණි තරුණයෙක් 'තමිළිණියක්කා' යැයි අඬගසා ඇත. එතැන සිටි එක් සහෝදරියකගේ නමද තමල් යනුවෙන් ආරම්භ වන්නකි. එහෙයින් කවුරුන් හෝ තමන්ට අඬගසන බව සිතා ත්‍රිරෝද රථය නතර කිරීමට පවසා ඇත. ත්‍රිරෝද රථයෙහි වේගය අඩුවත්ම එම තරුණයා සාක්කුවෙන් පිස්තෝලය ගෙන තිදෙනා වෙත වෙඩි පහරවල් එල්ල කර ඇත. එහිදී වගකීම් භාරව පැමිණි සහෝදරියගේ පපුවෙහි වෙඩි උණ්ඩ තුනකට වඩා වැඩි ප්‍රමාණයක් විය. බියට පත් ත්‍රිරෝද රථ රියදුරා පළා ගොස් ඇත. ජනයා එතරම් නොගැවසෙන එම මාර්ගයෙහි ගමන් කළ අයෙකුගේ වාහනයකින් තුවාල වූවන් රැගෙන ගොස් රෝහලට භාර දී ඇත.

තුවල වූ අය අක්කරෙපත්තුව රෝහලට ඇතුළත් කළ වහාම ඒ අයට ලේ අවශ්‍ය බව දන්වා ඇත. තිරුක්කෝවිල් ප්‍රදේශයේ සිට පැමිණි අපේ සටන්කාමියෝ රෝහලට යාමට පෙරම අක්කරෙපත්තුවේ සිට පැමිණි තරුණයෝ කිහිපදෙනෙක් සටන්කාමීන්ව බේරාගැණීමට ලේ දන් දී ඇත. තිදෙනාගේම තත්ත්වය ඉතාමත් බරපතළ හෙයින්ද, ඔවුන්ගේ ආරක්ෂාව අවදානම් තත්ත්වයක පැවැති හෙයින් ද වෙනත් ස්ථානයකට යැවීමේ අවශ්‍යතාව අවධාරණය කර දේශපාලන අංශයෙහි භාරකරු වෙත හදිසි පණිවිඩයක් යවා ඔහුගේ පිළිතුරක් බලාපොරොත්තුව උන්නෙමේ.

සටන් විරාමය ක්‍රියාත්මකව පැවැති හෙයින් සාම මහලේකම් කාර්යාලයෙහි මාර්ග යෙන් සිදුකළ ක්‍රියාමාර්ගවලට අනුව ආණ්ඩුවේ අනුග්‍රහයෙන් ඔවුන්ව කොළඹට රැගෙන යාමට තීරණය විය. ඒ අනුව ගුවන් හමුදාවට අයත් ඇව්රෝ වර්ගයේ ගුවන් යානයකින් ඔවුන්ව වෛද්‍ය ප්‍රතිකාර සඳහා කොළඹට රැගෙන ගිහය. එවැණි හදිසි ප්‍රතිකාරයක් කළේ නොමැති නම් ඔවුන් මියයාමට ඉඩ තිබුණි.

සුනාමි කටයුතු සඳහා තිරුක්කෝවිල් ප්‍රදේශයට ගිය ණිසා මට ආශ්‍රය කිරීමට ලැබුණු මිණිසුන් ද, දැකීමට ලැබුණු ස්ථාන ද විශේෂයෙන් සිංහල සහ මුල්ලිම් ජනයා සමඟ ආශ්‍රය කිරීමට ලැබීම ද මහත් ආගන්තුක අත්දැකීම් මට ලබා දුන්නේය. එම අත්දැකීම් මගේ දේශපාලන දැක්මෙහි ද මහත් වෙනසක් ඇති කිරීමට සමත් වූ බව මෙහි දී සඳහන් කිරීමට කැමැත්තෙමි.

2004 වසරේ නැඟෙනහිර පළාතේ ප්‍රචාරක කටයුතුවලට ගිය අවස්ථාවේ ත්‍රිකුණාමලයට ද ගියෙමි. ඒ වන විට එහි සෙන්පති වූවේ සොර්ණමිය. ත්‍රිකුණාමලයේ නගර ප්‍රදේශය

32 වන පිටුව